# කැලණිය අධ්‍යාපන කලාපය

## මධ්‍ය වාර්ෂික පරීක්ෂණය - 2016

### ඉතිහාසය

7 ශ්‍රේණිය | කාලය පැය දෙකයි

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු ඇසුරින් නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

1. අතීතයේ සෙල්ලිපිවල හේන් හඳුන්වා ඇත්තේ .
   i. හේන් යනුවෙනි .  ii. කනකු යනුවෙනි.
   iii. පිටබිම් යනුවෙනි.  iv.ඇතුළු බිම් යනුවෙනි.

2. ඇල්හේන් යනුවෙන් හඳුන්වන්නේ,
   i . අත්හැර දමන ලද හේන් ය.  ii. ඇල් වී වගා කළ හේන් ය
   iii. නවදැලි හේන් ය  iv. පාළු වී ගිය හේන් ය

3. නානාදේසී වලඤ්ජියාර් යනු,
   i.විදේශ වෙළඳ ශ්‍රේණිය  ii. වෙළඳ නගරය
   iii.දේශීය වෙළඳ ශ්‍රේණිය  iv. වෙළඳ සංවිධානය

4. අපේ පැරණි ලෝකුරු ශිල්පීන් අතින් නිෂ්පාදනය වූ භාණ්ඩය වන්නේ,
   i. හිස පළඳනා  ii. රෙදිපිළි
   iii. උළු ගඩොල්  iv. කැති පොරෝ

5.අපේ පැරණි ජන සමාජය තුළ කිරි ලබා ගැනීම සඳහා යොදා ගත් ගව දෙනුන් හැඳින් වූයේ
   i. කිරි ගෙරි  ii. ගැල් ගොන්  iii. කිරිගොන්  එළදෙනුන්

6. ඉන්දියාවේ පාණ්ඩ්‍ය කුමරකු වූ දෙවන වරගුණ වර්මන් කුමාරයා පාණ්ඩ්‍ය රාජ්‍ය උරුමය සඳහා කළ සටනක දී ආධාර ඉල්ලා මෙරටට පැමිණියේ ,
   i.දෙවන දප්පුල රජුගේ කාලයේ ය.  ii. පළමුවන සේන රජතුමාගේ කාලයේ ය.
   iii. දෙවන සේන රජතුමාගේ කාලයේ ය.  iv. නවවන අග්බෝ රජුගේ කාලයේ ය.

7. අනුරාධපුර යුගයේ රටතුළ හොඳ නීති රීති පද්ධතියක් ක්‍රියාත්මක වූ බවට කියාපාන සෙල්ලිපියකි.
   i. ඉරිපින්නියාව සෙල්ලිපිය  ii. වේවැල්කැටිය සෙල්ලිපිය
   iii. මිහින්තලේ පුවරු ලිපිය  iv. දෙවනගල සෙල්ලිපිය

8.පල්ලව රාජධානියේ අගනුවර වූයේ .
   i. කාංචිපුරය යි  ii.මධුරාපුරය යි  iii.තන්ජෝරය යි  iv.දෝ රදක්කිනිකය යි

9. මහා විජයබාහු රජතුමා ගැන හැදෑරීමේ දී වැදගත්වන මූලාශ්‍රයකි .
   i . මිහින්තලේ පුවරු ලිපිය  ii. පනාකඩුව තඹ සන්නස
   iii. දෙවනගල සෙල්ලිපිය  iv. සංගමු විහාර ලිපිය

10. 2011 වන විට යුනෙස්කෝ සංවිධානය විසින් සංස්කෘතික උරුම 704 ලෝක උරුම ලෙස නම් කර ඇත. ඉන් කොපමණ ප්‍රමාණයක් ලංකාවේ පිහිටා තිබේ ද?

i.හතකි. ii. නවයකි iii. අටකි iv.හයකි

අංක 11 සිට 15 දක්වා වාක්‍ය නිවැරදි නම් ( ) ලකුණ ද වැරදි නම් ( ) ලකුණ ද වාක්‍ය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

11.හතරවන උදය රජතුමා වෙළඳ පොළෙහි අකටයුතු කම් නතර කිරීමේ අරමුණින් ශිලා ලිපියක් පිහිටුවන ලදී. එය බදුලු ටැම් ලිපිය ලෙස හඳුන්වයි. ( )

12. පැරණි ජන සමාජය තුළ ගොවියන් ජීවත් වූ නම් ' කසීකාර ගම්' ලෙස හැඳින්වුණි ( )

13. දෙවන සේන යනු මානවම්ම රජ පරපුරට අයත් දෙවන දප්පුල රජුගේ පුතෙකි ( )

14. කැප්පෙටියා ශාකයේ වසන ලාක්ෂා කෘමියාගේ ශ්‍රාවය ලාක්ෂා කර්මාන්තය සඳහා අමුද්‍රව්‍යයක් ලෙස යොදා ගැණිනි. ( )

15. ශ්‍රී පාදස්ථානයට යන මාර්ගය ප්‍රතිසංස්කරණය කරවා එම ස්ථානයට ගම්බිම් පිදීම මහා පරාක්‍රමබාහු රජුගේ ආගමික සේවාවක් ලෙස සැලකේ. ( )

16 සිට 20 දක්වා ප්‍රශ්න වලට අදාළ නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා හිස් තැනෙහි ලියන්න.

16. වෙළදාම සම්බන්ධ වෙළඳ නගර ............................................ යනුවෙන් හැඳින්වේ.

17.කිරි, දීකිරි,මෝරු, ගිතෙල් , ................................ පස් ගෝරස වලට අයත් වේ.

18. පැරණි ජන ජීවිතය තුළ සූප ශාස්ත්‍රයෙහි දක්ෂ කාන්තාවන් ...................................... යනුවෙන් නම්කර ඇත.


19. පාලන කටයුතු වලදී මෙන් ම, අය බදු පැනවීමේ දී ද ............................ අනුව ක්‍රියා කිරීමට රජුට සිදුවිය.

20. දඹුලු රජමහා විහාරයේ විශිෂ්ට ...................................... නිසා 1971 දී ලෝක උරුම ලැයිස්තුවට ඇතුළත් කෙරුණි.

ii කොටස

- පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්යය වේ.
- තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

1). පහත පින්තූරයෙන් පෙන්වන්නේ පැරණි කාලයේ කර්මාන්ත සඳහා භාවිතා කළ උපකරණයන් හා එහි නිෂ්පාදනයන් ය. මෙම පින්තූරය ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



i.ඉහත පින්තූරයෙන් පෙන්වන කර්මාන්තය කුමක් ද? (ලකුණු 02)

ii. මෙම කර්මාන්තය සඳහා භාවිතා කරන ලද උපකරණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

iii.පින්තූරයෙන් පෙන්වන කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන භාණ්ඩ තුනක් හා එම නිෂ්පාදන ගොවිතැන් කටයුතු සඳහා යොදාගත් අවස්ථාවන් තුනක් පහත වගුව තුළ සටහන් කරන්න.

| නිෂ්පාදිත භාණ්ඩ | ගොවිතැන් කටයුතු සඳහා යොදාගත් අවස්ථාවන් |
|---|---|
| 1. ...<br>2. ..<br>3. | |

(ලකුණු 06)

iv.ඔබ සඳහන් කළ කර්මාන්තයට අමතරව පැරණි ජන ජීවිතය තුළ පැවැති කර්මාන්ත දෙකක් සඳහන් කර ඉන් එක් කර්මාන්තයක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 06)

2). i. හේන් ගොවිතැන ආශ්‍රයෙන් ගොවියා භාවිතා කළ වචන දෙකක් A හා B අක්ෂර වලින් පෙන්වා ඇත. එහි තේරුම ලියන්න.

A - ගිනියාතිකාව
B - හැලිකටා (ලකුණු 02)

ii. වී වැපිරීමේ සිට අස්වනු නෙලා ගැනීම තෙක් ගොයම ආරක්ෂා කර ගැනීම සඳහා අනුගමනය කළ සම්ප්‍රදායික ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. පැරණි ජන ජීවිතය කෘෂිකාර්මික කටයුතු සඳහා ගවයා උදව් කරගත් ආකාරය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

3). i. ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාමේ දී වැදගත් වූ වරායන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii. ශ්‍රී ලංකාව වෙළඳ සම්බන්ධතා පැවැත් වූ රටවල් හතරක් නම් කරන්න. (ලකුණු 04)

iii.අතීතයේ ශ්‍රී ලංකාවේ පැවැති අභ්‍යන්තර වෙළඳාම පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

4). i. මානවම්ම රජ පෙළපතටපෙර අනුරාධපුර යුගයේ දී වැඩි කාලයක් පාලන බලය දැරූ රජ පෙළපත් දෙක නම් කරන්න. (ලකුණු 02)

ii. පහත වගුව තුළ A තීරුවේ දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු වරහන් තුළින් තෝරා B තීරුවේ ලියන්න.

(ලකුණු 04)

| A | B |
|---|---|
| 1.මාන කුමාරයාට පෙර අනුරාධපුරය පාලනය කළ රජතුමා කවුද? | A |
| 2. මාන කුමාරයා සමඟ සම්බන්ධතා පැවැත් වූ දකුණුඉන්දීය රාජ්‍ය නම් කරන්න. | B |
| 3.මාන කුමාරයා රාජ්‍ය මධ්‍යස්ථානය පිහිටුවා ගත්තේ කොහේ ද? | C |
| 4. රජවූ පසුව මාන කුමාරයා හැඳින්වූ නම කුමක් ද? | D |

(ලකුණු 04)

iii.දෙවන සේන රජතුමාගේ පාණ්ඩ්‍ය රාජ්‍ය ආක්‍රමණය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

5). i.රාජ්‍ය පාලන කටයුතු වලදී රජුට සහාය වූ නිලධාරීන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

ii.මධ්‍ය පාලනයේ ඉහළම තැනැත්තා වූ රජතුමාට අයත් කාර්යයන් හතරක් ලියන්න. (ලකුණු 04)

iii.මහාවිජයබාහු රජතතුමාගෙන් ගතහැකි ආදර්ශ කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

6). i.අනුරාධපුර යුගයේ ශ්‍රී ලංකාව කෙරෙහි ඍජු බලපෑමක් ඇති කළ දකුණු ඉන්දීය රාජධානි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii.නිශ්ශංකමල්ල රජතුමා පිහිට වූ සෙල්ලිපි දෙකක් නම් කරන්න. (ලකුණු 04)

iii.පොළොන්නරුවේ රජකළ නිශ්ශංකමල්ල රජතුමා රටවැසියන්ගේ ශුභ සිද්ධිය උදෙසා අනුගමනය කළ ක්‍රියා මාර්ග දෙකක් සඳහන් කර ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

7).i.අනාදිමත් කාලයක සිට පරම්පරාවෙන් පරම්පරාවට උරුම වූ අස්පෘශ්‍ය සංස්කෘතික උරුම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii.යුනෙස්කෝ සංවිධානය විසින් ලෝක උරුම ලෙස පිළිගෙන තිබෙන සංස්කෘතික උරුම ස්ථාන හතරක් නම් කරන්න. (ලකුණු 04)

iii.අපේ සංස්කෘතික උරුම රැකගැනීමේ වටිනාකම මැයෙන් රචනාවක් ලියන්න. (ලකුණු 05)